**Ministry of Education**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
Tele/දුරකථන: 2785141-50 Fax/ෆැක්ස්: 2784846 Email/ඊමේල්: isurupaya@moe.gov.lk Web/වෙබ්: www.moe.gov.lk

## අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව සිදු කෙරෙන "Mother ශ්‍රී ලංකා" වැඩසටහන පාසල් පද්ධතිය තුළ අරඹයි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සේනාධි නායකත්වයෙන් උතුරේ ක්‍රියාත්මක මානුෂික මෙහෙයුම් අවසාන වීමත් සමගම ජනාධිපති කාර්යාලය මගින් මෙහෙයවන රට පුරා ක්‍රියාත්මක කිරීමට යන මහා සාමාජික ආර්ථික මෙහෙයුමේ පෙර ගමන්කරු ලෙස ශුභවාදී දේශීය චින්තනය පුබුදු වන "Mother ශ්‍රී ලංකා" වැඩසටහන "අපෙන් රටට" යන තේමාව යටතේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව පාසල් පද්ධතියේ සිසු දරුවන් තුළ ධනාත්මක ආකල්ප ඇති කිරීම සඳහා වන මූලික වැඩසටහන 2009 පෙබරවාරි මස 10 දින දකුණු පළාතේ ආරම්භ කරන ලදී. පෙබරවාරි 17 සිට විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුභවතුන් දැනුවත් කිරීමේ රැස්වීම් 11 ක් සංවිධානය කර ඇති අතර දකුණු පළාතේ සියලුම 1 A, B හා C පාසල් ඇතුළත් වන සේ පාසල් සිසුන් අතර සංවාද වැඩසටහනක් පාසල් 340 ක ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මිලියන විස්සක නෑ පරපුර සොයා යන ගමනේ දකුණු පළාත් හමුව දකුණු පළාත් ප්‍රධාන ලේකම් හා පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2009-02-10 දින අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් පවත්වන ලදී. එහි දී කලාප හා කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අමතා "Mother ශ්‍රී ලංකා" වැඩසටහන හඳුන්වා දීමේ ප්‍රධාන දේශනය අධ්‍යාපන අමාත්‍යාංශයේ පියදාස මාරඹගේ මහතා විසින් පවත්වන ලදී.

මේ සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම් ඒ. ඒ. සමරසිංහ, දකුණු පළාත් අධ්‍යාපන ලේකම් එම්. ඒ. විජේතිලක, ජනාධිපති කාර්යාලයේ ජානකී කුරුප්පුආරච්චි, අධ්‍යාපන අමාත්‍යාංශයේ එන්. ඒ. එස්. බණ්ඩාර, පී. කේ. ඩී. එස්. දේවප්‍රියා, ඩබ්. ඒ. විජේතුංග යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.



මාධ්‍ය ලේකම්
ජයවීර දෙල්පාගොඩ

**MediaUnit**

Tele/දුරකථන: 2784869 Fax/ෆැක්ස්: 2784869 Email/ඊමේල්: mediaunitmoe@yahoo.com

## Mother Sri Lanka Program conducted under a concept of His Excellency the President is launched within the school system

Along with the cessation of the humanitarian operations implemented in the North under the distinguished leadership of His Excellency the President Mahinda Rajapakse the 'Mother Sri Lanka' Program that awaken the optimistic national thinking will be implemented within the school system under the theme ' අපෙන් රටට ' as the fore runner in the Great Socio Economic Operation implemented by the Presidential Secretariat throughout the country.

Accordingly the preliminary program for the creation of positive concepts among students in the school system was launched in the Southern Province on 10th February 2008.Eleven awareness meetings were organized for Principals, In Service Advisors and Teachers from 17th February while arrangements have been made to conduct conversational programs in 340 schools among students which include all 1A, B and C type schools in the Southern Province.

In the march for meeting the generation of twenty million relations the Southern Provincial meet was held on 10.02.2009 under the leadership of Chief Secretary of the Southern Province and Provincial Secretaries of Education under the direction of the officers in the Ministry of Education. On this occasion the introductory speech relating to the 'Mother Sri Lanka ' Program was delivered by Mr. Piyadasa Marambage of the Ministry of Education addressing the Zonal and Divisional Directors of Education.

The participants for this meeting included Chief Secretary of the Southern Province Mr.A.A.Amarasinghe , Secretary Education of the Southern Province Mr.M.A.Wijetilake, Mrs.Janaki Kuruppuarachchi of the Presidential Secretariat and Mr.N.A.S.Bandara, Mr.P.K.D.S.Dewapriya, and Mr.W.A.Wijetunga from the Ministry of Education.